# බුද්ධශාසන අරමුදල
# புத்தசாசன நிதியம்
# BUDDHASASANA FUND

## බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
## புத்தசாசனம், மத மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
## Ministry of Buddhasasana, Religious and Cultural Affairs

මගේ අංකය / எனது இல. / My No. } බු.ශ.අ./01/01/10/පොදු(ii වෙළුම) | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2025.05. 21


සියළුම ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල ගෞරවණීය
ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා වෙත

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

**<u>බුද්ධශාසන අරමුදල මඟින් සිදු කරන ව්‍යාපෘති සම්බන්ධව දැනුවත් කිරීම.</u>**

1990 අංක 35 දරණ බුද්ධශාසන අරමුදල් පනත මඟින් පිහිටුවා ඇති බුද්ධශාසන අරමුදල, බුද්ධශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම සඳහා අරමුදල් එකතු කිරීම සම්පාදනය කිරීම සඳහා පිහිටුවා ඇත. බුද්ධශාසන අරමුදල මඟින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති පිළිබඳ ගෞරවණීය ස්වාමීන් වහන්සේලාගේ හා දස සිල් මෑණිවරුන්ගේ දැනුවත් භාවය අවම වීම හේතුවෙන් ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කිරීම අවම මට්ටමක පවතින බව නිරීක්ෂණයවේ. බුද්ධශාසන අරමුදල මඟින් පහත ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අතර, එම ව්‍යාපෘති සම්බන්ධව ප්‍රාදේශීය ශාසනාරක්ෂක මණ්ඩල රැස්වීම් වලදී ගෞරවනිය ස්වාමීන් වහන්සේලා/ දසසිල් මෑණිවරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**01. <u>භික්ෂු ප්‍රණාම මාසික දීමනාව</u>**

සම්බුද්ධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් තම දිවියම කැපකල ගරුතර ස්වාමීන් වහන්සේලා/ දස සිල් මෑණිවරු සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. අයදුම් කරන භික්ෂූන් වහන්සේලා/ දස සිල් මෑණිවරුන්ගේ පහත සුදුසුකම් සම්පූර්ණ කල යුතු වේ.

I. අයදුම් කරන දිනට වයස අවු.85ක් ඉක්මවා තිබීම.
II. පැවිදි දිවියට වසර 10කට වඩා සම්පූර්ණ වී තිබීම.
III. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සාමණේර/ දස සිල්මාතා ලියාපදිංචිය ලබා
IV. තිබීම.
V. රජයේ විශ්‍රාම වැටුපක් හෝ ඒ සමාන වෙනත් දීමනාවක් නොලැබීම.
VI. මාසිකව රු.10,000/- ක දීමනාවක් ප්‍රතිලාභී ස්වාමීන් වහන්සේලාගේ/ දස සිල්
VII. මෑණියන්ගේ බැංකු ගිණුම් වෙත බැර කරනු ලැබේ.

**02. <u>වෛද්‍යාධාර</u>**

හෘදයාභාද, පිළිකාව, වකුගඩු රෝග වැනි දීර්ඝකාලීනව ප්‍රතිකාර ලැබිය යුතු රෝගයන්ගෙන් පෙළෙන භික්ෂූන් වහන්සේලා/ දස සිල් මෑණිවරුන් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට මාසිකව රු.5000/-ක මුදලක් මෙම ව්‍යාපෘතිය මඟින් බැංකු ගිණුම වෙතබැර කරනු ලැබේ. එම ප්‍රතිලාභ ඉල්ලුම් කරන භික්ෂූන් වහන්සේලා/ දස සිල් මෑණියන් වහන්සේ පහත සුදුසුකම් සම්පූර්ණ කල යුතු වේ.

I. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සාමණේර/ දස සිල්මාතා ලියාපදිංචිය ලබා තිබීම.


අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07. இல. 135, ஸ்ரீமான் அனகாரிக்க தர்மபால மாவத்தை, கொழும்பு 07.
No. 135, Sreemath Anagarika Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office } 011 - 2307694, 011 - 2307674 | ෆැක්ස් / தொலைநகல் / Fax } 011 - 2303294 | ලේකම් / செயலாளர் / Secretary } 011 - 2303294 | වෙබ් / இணையத்தளம் / Web } www.mbra.gov.lk, www.templeslk.org

II. දීර්ඝ කාලීනව ප්‍රතිකාර ලබාගත යුතු රෝගයකින් පෙළෙන බව හා ඒ සඳහා ප්‍රතිකාර ලබා ගන්නා බවට රජයේ රෝහලක වෛද්‍යවරයෙකු සනාථ කර තිබීම.

III. රජයේ වැටුපක්/ විශ්‍රාම වැටුපක් හෝ ඒ සමාන වෙනත් දීමනාවක් නොලැබීම.

## 03. කැපකරු ශිෂ්‍යාධාර ක්‍රමය

පිරිවෙන් ආයතනවල ඉගෙනුම ලබන සාමණේර භික්ෂූන් වහන්සේ/ මෑණිවරුන්ගේ අධ්‍යාපනික කටයුතු පවත්වාගෙන යාම සඳහා මාසිකව රු.2000/-ක දීමනාවක් වසර 03ක කාලයක් දක්වා ලබා දෙනු ලැබේ. එම කැපකරු ශිෂ්‍යාධාර ක්‍රමයේ ප්‍රතිලාභ ලබා ගැනීමට පහත සුදුසුකම් සම්පූර්ණ කල යුතුය. අදාල දීමනාව තැපැල් කාර්යාල හරහා ගෙවනු ලැබේ.

I. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සාමණේර/ දස සිල්මාතා ලියාපදිංචිය ලබා තිබීම.

II. අයදුම් කරන දිනට වසර අවුරුදු 10 – 18 අතර වීම.

III. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි පිරිවෙනක අධ්‍යාපනය ලබන සාමණේර භික්ෂූන් වහන්සේ/ දස සිල් මෑණියන් වහන්සේ නමක් වීම.

IV. ජනාධිපති අරමුදලින් හෝ වෙනත් රජයේ ශිෂ්‍යාධාර ක්‍රමයක් හරහා ප්‍රතිලාභ නොලැබීම.

## 04. දුෂ්කර විහාරස්ථාන වල සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම.

අවම සනීපාරක්ෂක පහසුකම් පවතින දුෂ්කර විහාරස්ථානවල/ ආරාමවල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් ආධාර ලබා දෙනු ලැබේ. භික්ෂූන් වහන්සේලා/ දස සිල් මෑණිවරුන් තුන් නමක් හෝ ඊට අඩුවෙන් වැඩ සිටින විහාරස්ථානවල භික්ෂූන් වහන්සේ/ දස සිල් මෑණියන්ගේ භාවිතය වෙනුවෙන් අවම වශයෙන් එක් වැසිකිළියක් නොමැති වීම හා ගිහි (පිරිමි/ කාන්තා) වෙනුවෙන් වැසිකිළි 02ක් වත් නොමැති විහාරස්ථාන/ ආරාම දුෂ්කර විහාරස්ථාන ලෙස සලකනු ලැබේ. භික්ෂූන් වහන්සේ/ දස සිල් මෑණිවරු තුන් නමකට වඩා වැඩ සිටින විට උන් වහන්සේලාගේ පරිහරණය සඳහා වැසිකිළි දෙකක් නොමැති විහාරස්ථානයද දුෂ්කර විහාරස්තානයක් ලෙස සලකනු ලැබේ. ඉහත අවම වැසිකිළි ප්‍රමාණය තිබුනද, වයස්ගත වීම, රෝගී තත්වයෙන් පෙළීම වැනි හේතුවන භික්ෂූන් වහන්සේ/ දස සිල් මෑණියන්ගේ ප්‍රයෝජනය සඳහා කොමඩ් වැසිකිළියක් සකස් කර ගැනීම සඳහා ශාසනාරක්ෂක මණ්ඩල ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේ/ ප්‍රා දේශීය ලේකම්ගේ විශේෂ නිර්දේශය මත ආධාර මුදල ලබා දීම සම්බන්ධව සලකා ලබනු ලැබේ.

I. ඉහත නිර්ණායක සම්පූර්ණ කරන විහාරස්ථාන/ ආරාමයක නව වැසිකිළියක් ඉදි කිරීමට රු.250,000/- ලබා දෙනු ලැබේ.

II. විහාරස්ථානය/ ආරාමයේ පවතින වැසැකිළි භාවිතා කිරීමට නොහැකි තත්වයේ පවතිනම් ඒවා අලුත්වැඩියා කිරීමට එක් වැසිකිළියකට රු.75,000/- බැගින් උපරිම වැසැකිළි 02ක් සඳහා රු.150,000ක් ගෙවනු ලැබේ. (ඉහත සඳහන් ප්‍රධානයන් ඉක්මවා ඇති විහාරස්ථාන/ ආරාම පවතින වැසිකිළි අලුත්වැඩියා කිරීමට ඉහත ආධාර ලබා දෙනු ලැබේ.)

III. ආධාර ඉල්ලුම් කරන විහාරස්ථානය බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබීම.

IV. පසුගිය ආසන්න වසර 03ක කාලය තුළ විහාරස්ථාන සංවර්ධන කටයුතු සඳහා රජයෙන් ප්‍රතිපාදන ලබා නොතිබීම.

V. ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරි විසින් සකස් කරන ලද ඇස්තමේන්තුවක් ප්‍රකාරව කාර්ය නිම කිරීම සඳහා මුදල් ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදේ.

VI. බුද්ධශාසන අරමුදල මඟින් කරනු ලබන ඉහත ව්‍යාපෘති හතරෙහි ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් ප්‍රතිලාභ අපේක්ෂා කරන භික්ෂූන් වහන්සේගේ/ දසසිල් මෑණියන්/විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් ලේකම් බුද්ධශාසන අරමුදල, අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07 ලිපිනයට යොමුකල යුතු අතර ප්‍රතිලාභ අයදුම් කිරීමට අදාළ අයදුම්පත්‍ර ය හා අනෙකුත් වැඩිදුර තොරතුරු අයදුම් කරන ස්වාමීන් වහන්සේට/දසසිල් මෑණියන්ට /ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

05. <u>බුදුපුත් සුරක්ෂා රක්ෂණ යෝජනා ක්‍රමය.</u>

රජයේ හෝ පුද්ගලික අංශයේ රක්ෂණ යෝජනා ක්‍රමයකින් ප්‍රතිලාභ නොලබන භික්ෂූන් වහන්සේලා/ දස සිල් මෑණිවරුන්ට හදිසි අසනීප තත්වයකදී වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන් දැරීමට සිදු වන වියදම් සඳහා සහනයක් ලබා දීම වෙනුවෙන් " බුදුපුත් සුරක්ෂා රක්ෂණ" ක්‍රමය ආරම්භ කර පවත්වාගෙන යනු ලැබේ. බුදුපුත් සුරක්ෂා රක්ෂණ ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබීමට පහත නිර්ණායක සම්පූර්ණ කල යුතුවේ.

I. බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ශ්‍රී ලාංකික භික්ෂූන් වහන්සේ/ දස සිල් මෑණියන් වහන්සේ නමක් වීම.

II. රාජ්‍ය සේවයේ හෝ වෙනත් ආයතනයක රැකියාවක නියුතු නොවීම.

III. රජයේ හෝ වෙනත් රක්ෂණ යෝජනා ක්‍රමයකින් ප්‍රතිලාභ නොලබන භික්ෂූන් වහන්සේ/ දස සිල් මෑණියන් වහන්සේ නමක් වීම.

IV. බුදුපුත් සුරක්ෂා රක්ෂණ යෝජනා ක්‍රමයේ ලියා පදිංචි වී රක්ෂණ හිමිපතක් ලබා තිබීම.

V. බුදුපුත් රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ මෙතෙක් ලියාපදිංචි වී රක්ෂණ හිමිපතක් ලබා ගෙන නොමැති භික්ෂූන් වහන්සේ/ දස සිල් මෑණිවරුන්ට අදාළ අයදුම් පත්‍රය බෞද්ධ කටයුතු සමායෝජක විසින් ලබා ගෙන සම්පූර්ණ කර විධායක නිලධාරී බුදුපුත් සුරක්ෂා අංශය, අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07 ලිපිනයට යොමු කිරීමෙන් ඉහත රක්ෂණ යෝජනා ක්‍රමයේ ප්‍ර තිලාභ ලබා ගත හැක.

VI. ඉහත රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් ගෙවනු ලබන ප්‍රතිලාභ පිළිබඳ විස්තර ඇමුණුම් 01 මඟින් දක්වා ඇත.

VII. බුදුපුත් සුරක්ෂා රක්ෂණ යෝජනා ක්‍රමයේ ලියාපදිංචි වී හිමිපතක් ලබා ඇති භික්ෂූන් වහන්සේ/ දස සිල් මෑණියන් වහන්සේ නමක් රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් අදාළ අයදුම් පත්‍රය බෞද්ධ කටයුතු සමායෝජක මඟින් ලබා ගෙන සම්පූර්ණ කර වෛද්‍ය වාර්තාවල සහතික පිටපත් ඇතුළු අනෙකුත් ලේඛන සමඟ ප්‍රතිකාර ලබා ගත් දින සිට දින 90ක් ඇතුලත ප්‍රා දේශීය ලේකම් කාර්යාලයට භාර දිය යුතු වේ.

06. බුද්ධශාසන අරමුදල මඟින් ක්‍රියාත්මක කරනු ලබන ඉහත ව්‍යාපෘතිවලට අදාල අයදුම්පත්‍ර බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ www.mbs.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකි බවද කාරුණිකව දන්වා සිටිමි.

අසංක රත්නායක
ලේකම්
බුද්ධශාසන අරමුදල

පිටපත් :-

1. ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේ - සමස්ථ ලංකා ශාසනාරක්ෂක මණ්ඩලය
2. ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේ - සියළුම දිස්ත්‍රික් ශාසනාරක්ෂක මණ්ඩල
3. බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්
4. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්

} කා . දැ . ගැ . ස . ගෞරව යෙන් හා අ . ක . ස .